Australian Government

BE COVIDSAFE

# COVID-19 සඳහා පරීක්ෂා කර ගැනීම

ඔබට කිසිදු COVID-19 රෝග ලක්ෂණයක් ඇතිනම්, ඒවා කොතරම් අඩු වුවද, හැකි විගස පරීක්ෂා කරගත යුතුය. කලින් රෝග ලක්ෂණ හඳුනා ගැනීම යනුවෙන් අදහස් වන්නේ වෛරසය ඔබගේ මිතුරන්ට, පවුලේ අයට සහ ප්‍රජාව වෙත පැතිරයාම වළක්වා ගත හැකි බවයි.

## පරීක්ෂණ ආකාර

ඔබට COVID-19 වෛරසය ඇතිද යන්න සොයා ගැනීම සඳහා පරීක්ෂණ ආකාර 2 ක් ඇත:

- පොලිමරේස් චේන් රිඇක්ෂන් (PCR)
- රැපිඩ් ඇන්ටිජන් ස්වයං පරීක්ෂා (RATs).

## පරීක්ෂා කල යුත්තේ කොයි අවස්ථාවලද

පහත අවස්ථාවල වෝල්ක් ඉන් හෝ ඩ්‍රයිව් ත්‍රෲ COVID-19 පරීක්ෂණ සායනයකට ඔබ යා යුතුය:

- COVID-19 රෝග ලක්ෂණ ඇතිනම්
- රෝගය ඇති බවට පරීක්ෂණයකින් සනාථ වුණු අයෙකුගේ සමීපතමයෙකු නම්
- සෞඛ්‍යය වෘත්තීකයෙකු විසින් එසේ කිරීමට උපදෙස් ලබා දුන් විට.

ඔබට COVID-19 රෝග ලක්ෂණ ඇතිනම් පරීක්ෂණ සායනයකදී සීමාරහිත COVID-19 පරීක්ෂණ (රැපිඩ් ඇන්ටිජන් හෝ PCR) සිදුකර ගත හැකිය. ඔබගේ ප්‍රතිඵල එන තෙක් නිවසේ ස්වයං හුදෙකලාවී සිටින්න.

පහත අවස්ථාවල COVID-19 පරීක්ෂණයක් සිදුකර ගත යුතු නැත:

- රෝග ලක්ෂණ නැති අවස්ථාවල
- රජයේ රෝහලක ප්‍රතිකාර ලබා ගන්නා අවස්ථාවක
- ACT, NSW, SA, හෝ Vic වෙත සංචාරය කරන විට.

ඔබට නොමිලේ PCR පරීක්ෂණයක් කර ගැනීම සඳහා ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ නිත්‍ය වැසියෙකු වීම අවශ්‍ය නැත. ඔබට ආසන්නයේ ඇති නොමිලේ පරීක්ෂා කරන සායනයක් සොයා ගැනීම සඳහා ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි සෞඛ්‍යය වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

ඔබගේ පරීක්ෂණය සිදුකල පසු, ඔබගේ ප්‍රතිඵලය ලැබෙන සෙක් නිවසේ හුදෙකලා විය යුතුය.

## රැපිඩ් ඇන්ටිජන් ටෙස්ට් (RATs) ලබා ගැනීම

රැපිඩ් ඇන්ටිජන් ටෙස්ට් සහභාගිවන ෆාමසි, සුපර් මාර්කට් සහ වෙනත් සිල්ලර සාප්පු වෙතින් මිලට ගත හැකිය.

ජනවාරි 24 දින සිට සුදුසුකම් ඇති කොමන්වෙල්ත් සහන කාඩ්පත් ඇති අය සඳහා මාස 3 ක කාලයක් සඳහා RATs 10 ක් දක්වා (මාසයකට 5 ක උපරිමයකට යටත්ව) සහභාගි වන ප්‍රජා ෆාමසි වෙතින් නොමිළේ ලබා ගත හැකිය.

සුදුසුකම් ඇති සහන කාඩ්පත් අතරට පහත ඒවා ඇත:

- Commonwealth Seniors Health Card
- Department of Veteran's Affairs Gold, White හෝ Orange Card
- Health Care Card
- Low Income Health Card
- Pensioner Concession Card.

ඔබ පුද්ගලිකව සහභාගිවන ප්‍රජා ෆාමසියකට ගොස් ඔබගේ කොමන්වෙල්ත් සහන කාඩ්පත ඉදිරිපත් කල යුතුය.

ඔබගේ සහන කාඩ්පැත් තොරතුරු වාර්තා කර ගැනීමට ඔබ විසින් කැමැත්ත ලබාදීම අවශ්‍යවේ. ෆාමසිය මගින් ඔබට දැනටමත් RATs ලබාදී ඇතිද යන්න ඇතුළුව ඔබගේ තොරතුරු ෆාමසිය මගින් පරීක්ෂා කර බලනු ඇත.

ෆාමසිය මගින් සුදුසුකම් ඇති සෑම අයෙකුටම අවම වශයෙන් RATs 2 ක් ලබා දෙනු ඇත. තොග ඇතිනම් සෑම සුදුසුකම් ඇති අයෙකු හටම මාසික සීමාව තෙක් RATs ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හැකිය.

ෆාමසි, සුපර්මාර්කට් සහ වෙනත් සිල්ලර වෙළඳපොළ වලින් RATs ලබා ගැනීමට හැකිවනු ඇත. ෆාමසිය වෙත යාමට පෙර දුරකථනයෙන් අමතා නව සැපයුම් ඇතිද යන්න සොයා බැලිය යුතුය.

## COVID-19 නැති බවට පරීක්ෂණය සිදුවීම

ඔබගේ රැපිඩ් ඇන්ටිජන් හෝ PCR මගින් ඍණ ප්‍රතිඵල ලබා දේ නම් තව දුරටත් හුදෙකලා වීම අවශ්‍ය නැත.

## COVID-19 ඇති බවට පරීක්ෂණ ප්‍රතිඵල ලැබීම

ඔබගේ රැපිඩ් ඇන්ටිජන් හෝ PCR ප්‍රතිඵල මගින් COVID-19 ආසාදනය ඇති බවට තහවුරු වුණි නම්, වහාම නිවසේ හුදෙකලා විය යුතුය.

ඔබ PCR පරීක්ෂාවක් කලේ නම්, ඔබගේ පළාත් සෞඛ්‍යය දෙපාර්තමේන්තුව ඔබ සමඟ සම්බන්ධ වනු ඇත.

ඔබ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂාවක් කලේ නම් ඒ බව සෞඛ්‍යය බලධාරීන්ට දැනුම් දිය යුතුය. COVID-19 ආසාදිත අයෙකු ලෙස ලියාපදිංචිවීම සඳහා ඔබගේ පළාතේ සෞඛ්‍යය දෙපාර්තමේන්තුව අමතන්න, නැතිනම් දුරකථන අංක **1800 020 080** ඔස්සේ National

Coronavirus Helpline අමතන්න භාෂා පරිවර්තන සේවා සඳහා දුරකථන අංක **131 450** අමතන්න.